# UNIVERSITY GRANTS COMMISSION

## Finance Circular Letter No. 04/2018

15th November, 2018

Vice-Chancellors of Universities,
Directors of Institutes,
Rectors of Campuses.

**Procurement of Motor Vehicles for Government Agencies**

The University Grants Commission adopted the National Budget Circular No. 03/2018 dated 16th July, 2018 issued by the Ministry of Finance and Mass Media on the above subject. Copy of the circular is enclosed herewith for compliance by all universities and Higher Educational Institutions.

The letter is available on the UGC website www.ugc.ac.lk

Prof. Mohan De Silva
Chairman

Cc.
1. Secretary/MOHE&CA
2. Vice-Chairman/UGC
3. Secretary/UGC
4. Registrars of Universities
5. Accountant/UGC
6. Bursars of Universities
7. Snr. Asst./Asst. Registrars of Institutes/Campuses
8. Snr. Asst./Asst. Bursars of Institutes/Campuses
9. Snr. Asst. Secretary/Personnel/UGC
10. Chief Internal Auditor/UGC
11. Auditor General
12. Govt. Audit Superintendent/UGC
13. Govt. Audit Superintendent/Universities

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

| | | |
|---|---|---|
| කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance | (+94)-11-2484500<br>(+94)-11-2484600<br>(+94)-11-2484700 | |
| කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media | (+94)-11-2513459<br>(+94)-11-2513498<br>(+94)-11-2512324 | |
| ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance | (+94)-11-2449823 | |
| ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media | (+94)-11-2513458 | |
| වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites | www.treasury.gov.lk<br>www.media.gov.lk | |


මගේ අංකය / எனது இல. / My No. BD/1/16/3

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2018.07.16

ජාතික අයවැය චක්‍රලේඛ අංක. **03/2018**

සියලුම: අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

<u>රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය</u>

2018 අප්‍රේල් මස 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, රාජ්‍ය ආයතනවල භාවිතය සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් කර ඇති පරිදි අත්පිට මුදලට, මූල්‍ය කල්බදු ක්‍රමය සහ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් වාහන මිලදී ගැනීම අනුමතකර ඇත. ඒ අනුව, වාහන මිලදී ගැනීම සඳහා මෙම චක්‍රලේඛයේ ලබාදී ඇති උපදෙස් පිළිපැදීම සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ සහ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ නිරතව සිටින සියලුම නිලධාරීන්ගේ වගකීම වේ.

**02.** අදාළවීම

මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ වනුයේ :

(i) ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සපයනු ලබන රාජ්‍ය ආයතන - අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක සහ රාජ්‍ය ආයතන

(ii) පළාත් සභා සහ පළාත් පාලන ආයතන

ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සැපයීමක් සිදු නොකරනු ලබන රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් වන වාහන ප්‍රසම්පාදනයට අදාළව වෙනම චක්‍රලේඛයක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කෙරෙනු ඇත.

**03.** වාහන අවශ්‍යතා තක්සේරු කිරීම

(අ) වාහන මිලදී ගැනීම සඳහා වන සියළුම ඉල්ලීම් නිසිපරිදි සම්පූර්ණ කරන ලද, මෙම චක්‍රලේඛයේ **ඇමුණුම I** හි දක්වා ඇති ආකෘති පත්‍රය මගින් අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා හරහා මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට පෙර එම ඉල්ලීම් අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිත්වය දරණ කමිටුවක් මගින් පහත නිර්ණායකයන් අනුව සමාලෝචනය කළ යුතුය.

(i) වාහනය/වාහන අවශ්‍යතාවය සඳහා වන හේතු.
(ii) ආයතනයේ වාහන අවශ්‍යතාවය හා දැනට පවතින වාහන සංචිතය .
(iii) දැනට පවතින ප්‍රතිස්ථාපනය කිරීමට නියමිත වාහනයේ/වාහනවල ආයුකාලය සහ තත්ත්වය.
(iv) පවතින වාහනය/වාහන සඳහා පසුගිය වර්ෂ 3ක නඩත්තු පිරිවැය.
(v) වෙන්කර ඇති වාහන සංඛ්‍යාව සහ ප්‍රවාහන දීමනා ලබාගන්නා නිලධාරීන් සංඛ්‍යාව.
(vi) අංක 02/2015 හා 2015.07.10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අපහරණය කරන ලද වාහන සංඛ්‍යාව .
(vii) මෙම චක්‍රලේඛයේ පවතින ප්‍රතිපාදන සහ මෙම සමාලෝචනය සඳහා යෝග්‍ය වන වෙනත් කරුණු .

(ආ) රජයේ වාහන ඵලදායී අයුරින් භාවිතා කිරීම සහතික කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම්, රාජ්‍ය ආයතනයට අදාළවන පහත කරුණු සළකා බලමින්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් විධිමත් අධ්‍යයනයක් කරනු ඇත.

(i) සමාලෝචන කමිටුවේ නිර්දේශය
(ii) ආයතනික විධිවිධාන
(iii) සංචිතයේ පවත්නා වාහන උපරිම ආර්ථික ඵලදායිතාවයක් ලැබෙන ලෙස භාවිතා කිරීම.
(iv) රාජ්‍ය අයතනයේ පවතින වාහන සංචිතය තුළ අවශ්‍යතාවය කළමනාකරණය කරගැනීමේ හැකියාව .

(ඇ) ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් ඔහුගේ/ඇයගේ නිර්දේශ සහිතව එම අයදුම්පත ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ඇත .

**04.** මහා භාණ්ඩාගාරයේ අනුමැතිය

වාහන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ නිර්දේශ මත පදනම්ව හා පවත්නා මූල්‍ය සම්පත් අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් වාහන ප්‍රසම්පාදනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙනු ඇත.

05 ඡේදයේ විස්තර කර ඇති එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව අනුමැතිය ලබාදීමේ ආදර්ශ ලිපි ඇමුණුම් **II, III** සහ **IV** හි දක්වා ඇත.